## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

### 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රමාණාත්මක බව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශණ වල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 03 අනුව කෙරිගෙන යන වැඩ, ඉතිරි තොග, සහ ප්‍රදාන යන අයිතම සඳහා වූ ගිණුම් ප්‍රතිපත්ති හෙලිදරව් කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල පාඨමාලා ආදායම් ගිණුම් තැබීමේද අයවීම අවිනිශ්චිත පාඨමාලා ආදායම වෙනුවෙන් සිදුකළ 1% ක එනම් රු.4,573,445 ක ප්‍රතිපාදනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 අනුව වියදමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ආදායමෙන් අඩුකර දක්වා තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 380 න් ආවරණය නොවන විශ්වවිද්‍යාලයේ ආදායම් වශයෙන් ගිණුම් ගත කළ යුතු රු.37,379,907 කින් රු.20,881,727 ක් පමණක් කෙටිකාලීන පාඨමාලා ආදායම් ලෙසත්, රු.16,498,180 ක් විශේෂිත අරමුදල් ලෙසත් ගිණුම්ගත කර තිබුණි. මෙකී රු.16,498,180 ක ආදායම, ආදායම් ලෙස හා ඊට අදාල වියදම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර වෙනත් මූලාශ්‍ර ආදායමෙහි උපචිත ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 10 අනුව මෙම ආදායම ගිණුම් තැබීම සම්බන්ධයෙන් වූ ගිණුම් ප්‍රතිපත්තිය හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 ට අනුව තීරණය කර ගිණුම් තැබිය යුතු වුවත් ඒ අනුවද කටයුතු කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී සිදු ව තිබූ අඩුපාඩු පිළිබඳ නියැදි පරීක්ෂණ අනුව අනාවරණය වී තිබූ රු.1,088,520,977 ක් වූ ස්ථාවර වත්කම් වලට අදාල අඩුපාඩු හා නියැදි පරීක්ෂණයෙන් බැහැර වත්කම් වල නිවැරදිතාවය පිළිබඳ තවදුරටත් සොයාබලා එම වටිනාකම් නිවැරදි කර ගැලපීම් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන වත්කම්, සමුච්චිත ක්ෂය සහ ප්‍රත්‍යාගණන සංචිතය යන ශේෂයන්හි නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. 2012 වර්ෂයේ ඉදිරිපත් කරන ලද තක්සේරු දෙපාර්තමේන්තු අතුරු වාර්තා අනුව ඉඩම් වටිනාකම රු.193,888,000 කින් අඩු විය යුතු බව හා ගොඩනැගිලි වටිනාකම රු.53,905,317 කින් වැඩි විය යුතු බව මූල්‍ය ප්‍රකාශන සටහන් මගින්ද පෙන්වා තිබුණි.

(ආ) (i) දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති ආධාර වශයෙන් 2004 - 2010 කාල සීමාව තුළ රු. මිලියන 1,896.5 ක වටිනා වාහන, ලීබඩු, යන්ත්‍ර සහ උපකරණ ලැබී තිබූ නමුත් කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා පිරියත අගය රු.මිලියන 663.5 ක් අඩුවෙන්ද වාහන, ලී බඩු සහ විද්‍යාගාර උපකරණ රු.මිලියන 144 ක් වැඩියෙන්ද ගිණුම් තබා තිබූ අතර එක් එක් වර්ෂය තුළ ලැබුණු භාණ්ඩ ප්‍රමාණය අනුව ගැලපීමේදී රු. මිලියන 374.4 ක සමුච්චිත ක්ෂය ප්‍රමාණයක් ගිණුම් වලින් අත්හැර දමා තිබුණි.

(ii) විශ්වවිද්‍යාලයේ නාවල ප්‍රධාන පරිශ්‍රයේ සහ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන වල අදාල කාලසීමාව තුළ රු. මිලියන 971.9 ක් වටිනා ඉදිකිරීම් සිදුකර තිබූ නමුත් එය රු.මිලියන 903.8 ක් ලෙස රු.මිලියන 68.1 ක් අඩුවෙන්ද එයට අදාල සමුච්චිත ක්ෂය රු.මිලියන 12.4 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබූ අතර ඉදිකිරීම් නිමවූ වර්ෂය නිවැරදිව නිශ්චය නොකිරීම සහ ප්‍රාමාණිකෘත හානි වන්දි (Liquidated Damages) සැලකිල්ලට නොගැනීම නිසා සිදු වූ සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.මිලියන 26.9 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(iii) ඉහත (i), (ii) ඡේද වල සඳහන් ගිණුම්කරණ දෝෂ හේතු කොට ගෙන ප්‍රවර්ථන වර්ෂයේ ආධාර ගිණුමේ ශේෂය රු.මිලියන 587.6 කින්ද එයට අදාල ක්‍රමක්ෂය ප්‍රමාණය රු.මිලියන 359.9 කින්ද අඩුවී තිබුණි.

### 1.2.4 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දුරස්ථ අධ්‍යාපන පරිගණක පිවිසුම් මධ්‍යස්ථාන (NODES Access Centres) විවෘත විශ්වවිද්‍යාලීය ප්‍රාදේශිය / අධ්‍යයන මධ්‍යස්ථාන 20 ක පවත්වාගෙන යනු ලබන අතර එම මධ්‍යස්ථාන සඳහා විශ්වවිද්‍යාලය විසින් සපයා ඇති ගොඩනැගිලි, ජලය, විදුලිය, ආරක්ෂණ හා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් 2010 හා 2011 වර්ෂ වලට අදාලව අයවිය යුතු රු.21,139,200 ක් ගිණුම් ගතකර නොතිබුණු අතර එම මුදල් අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලීය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විදේශීය ශිෂ්‍යත්ව ලබාදීමේදී එළඹ තිබූ බැඳුම්කර කඩකර තිබූ ආචාර්යවරුන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු, වටිනාකම රු. 6,759,607 ක් වූ බැඳුම්කර අයකර ගැනිම සම්බන්ධයෙන් ගෙන තිබූ නිතීමය ක්‍රියාමාර්ග වල ප්‍රගතිය දුර්වල මට්ටමක තිබූ අතර අයවිය යුතු බැඳුම්කරවල වටිනාකම රු.23,187,953 ක් වූ නිලධාරීන් 13 ක් බැඳුම්කර කඩකර වසර 03 ක් ඉක්මවා ඇතත් නතීමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කර තිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද පහත සඳහන් විෂයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| (අ) ආධාර වශයෙන් ලද - ලී බඩු | 116,887,429 | වත්කම් නිවැරදිව ලැබුණු |
| - කාර්යාල උපකරණ | 448,144,791 | බවට, භෞතිකව |
| - විද්‍යාගාර උපකරණ | 672,836,393 | සත්‍යාපනය කල බවට, |
| - යන්ත්‍ර සහ පිරියත | 113,605,088 | වත්කම් වටිනාකම නිවැරදි බවට හා නියමිත ස්ථානවල පවතින බවට වූ සාක්ෂි. |
| (ආ) ආධාර යටතේ වූ කාර්ය මණ්ඩල පුහුණු | 2,021,684 | ගෙවීම් වවුචරය හා අනුකාරක ලියවිලි |

## 1.2.6 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා

නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| මුදල් රෙගුලාසි 139 හා 261 | ගෙවීම් කිරීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් බැංකු ශේෂයක් පවතින බව තහවුරු කරගත යුතු වන නමුත් බැංකු ජංගම ගිණුම් 06 ක ශේෂ ඉක්මවා එකතුව රු.1,502,206 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණි. |
| මුදල් රෙගුලාසි 177 | ප්‍රාදේශීය කාර්යාල මගින් එකතු කරගන්නා මුදල් දිනපතා ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කළ යුතු වුවත් පොළොන්නරුව, කුරුණෑගල, ගම්පහ හා කෑගල්ල අධ්‍යයන මධ්‍යස්ථාන වල පාඨමාලා අයදුම්පත්‍ර අලෙවි ආදායම ප්‍රේෂණය කිරීම අයදුම්පත්‍ර නිකුත් කිරීමේ අවසන් දිනයද ඉක්මවා දින 23 දක්වා ප්‍රමාද කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. මෙම අධ්‍යයන මධ්‍යස්ථාන වල අයදුම්පත්‍ර පිළිබඳ ලේඛනගත කිරීම හා පාඨමාලා අනුව අංක වෙන්කර ගැනීමද නිසි පරිදි සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 371 (2) (ආ) | (i) සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 31 දක්වා රු.20,000 ට වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම 130 ක් නිකුත් කර තිබූ අතර එහි එකතුව රු.7,097,276 ක් විය. මින් අවස්ථා 64 කදී ලබාදුන් අත්තිකාරම් රු.50,000 සිට රු.300,000 දක්වා විය. |
| | (ii) එකී කාලය තුල අවස්ථා 16 කදී වියදම් ඇස්තමේන්තුවකින් තොරව ලබා දී තිබූ රු.466,895 ක අත්තිකාරම් වලින් රු.243,497 ක් එනම් 52% ක් වැයකර නොතිබුණි. |
| | (iii) නිශ්චිත කාර්යන් සඳහා ලබාදෙන අත්තිකාරම් මුදල් එම කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත් එකතුව රු.972,945 ක් වූ අවස්ථා 27 කදී ලබාගන්නා ලද අත්තිකාරම් මුදල් පියවීම දින 11 සිට 55 දක්වා ප්‍රමාදකර තිබුණි. |
| මුදල් රෙගුලාසි 395 | 2011 දෙසැම්බර් 31 දිනට මුදල් පොත් අනුව ශේෂවල එකතුව රු.6,390,332 ක් වූ ජංගම ගිණුම් 04 කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| 2003 ජුනි 22 දින හා අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.1 ඡේදය | 2011 - 2016 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් සහ විශ්වවිද්‍යාලය සතුව පවතින සම්පත් පිළිබඳ විස්තරයක් ඇතුලත් කර නොතිබුණි. |
| 5.2.1. ඡේදය | අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී අයවැය ගත ආදායම් වියදම් විස්තරය, ශේෂපත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වූ අයවැය ගත ප්‍රාග්ධන වියදම් සැලැස්ම යන ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. |
| (v) විශ්වවිද්‍යාල හා උසස් | (i) අංශ 04 ක ලැප්ටොප් පරිගණක, වසා තිබූ කාමර වල තිබූ |

| | |
|---|---|
| අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XXVI වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය හා මුදල් රෙගුලාසි 757 (ඇ) (2) | වත්කම්, දේශකවරුන්ගේ පාලනය යටතේ වූ වත්කම් යන වත්කම් භෞතිකව සත්‍යාපනය නොකර සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කර තිබුණි.<br>(ii) අංශ 05 ක තිබූ පාවිච්චියට ගත නොහැකි අයිතම 78 ක් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>(iii ) ස්ථාවර වත්කම් සමීක්ෂණය තුලින් අනාවරණය කර තිබූ අංශ 06 කට අදාල අයිතම 833 ක භාණ්ඩ ඌණතාවයන් හා අයිතම 79 ක භාණ්ඩ අතිරික්තයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

## 1.2.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවෘත විශ්වවිද්‍යාලයේ පාර්සල් ප්‍රවාහනය කිරීම සඳහා වාර්ෂික මිල කැඳවීමකින් තොරව, ගිවිසුමකට එළඹීමක් නොකර පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර මෙ සඳහා 2010 හා 2011 වර්ෂ වල පිළිවෙලින් රු.1,018,773 ක් හා රු. 965,756 ක් ගෙවා තිබුණි. මෙහිදී අදාල පාර්සල් වල ආරක්ෂිතභාවය පිළිබඳව සැලකිලිමත්ව නොතිබුණි.

(ආ) 1994 ජුනි 14 දින අංක 95 දරන භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇමතූ අංක BD/PE1/174/11 දරණ ලිපියට අනුකූල නොවන ලෙස 2011 වර්ෂයේදී දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනාව ලෙස රු.1,172,902 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) කෑගල්ල අධ්‍යයන මධ්‍යස්ථානට මධ්‍යස්ථාන භාර නිලධාරියකු පත්කිරීමෙන් පසුවද එම තනතුරෙහි ඊට පෙර සේවය කර විශ්‍රාම ගිය නිලධාරියෙකුද අනුමැතියෙන් තොරව දෛනික වැටුප් ගෙවමින් සේවයෙහි යොදවා තිබූ අතර කිසිදු අධීක්ෂණයකින් තොරව ඔහුගේ අභිමතය පරිදි පෞද්ගලිකව පැමිණීමේ ලේඛනයක් භාවිතා කරමින් දෛනික වැටුප් ලබා ගෙන තිබුණි. මේ අනුව 2011 ජුනි මස සිට දෙසැම්බර් දක්වා එකතුව රු.79,475 ක මුදලක් එම විශ්‍රාමික නිලධාරියාට ගෙවා තිබුණි.

## 1.2.8 මතභේදයට තුඩුදුන් කරුණු

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්වවිද්‍යාලයේ පාඨමාලාවන් සඳහා සිසුන් විසින් විශ්වවිද්‍යාලීය රැස්කිරීමේ ගිණුමට මුදල් බැර කරනු ලැබේ. එසේ බැරකළ මුදල් දෛනිකව හඳුනාගෙන අදාල සිසුන්ගෙන් ලද මුදල් ලෙස සටහන් නොකිරීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට ඉදිරියට එන රු.7,776,098 ක හඳුනා නොගත් ශේෂයක් නිරීක්ෂණය වූ අතර හඳුනානොගත් ලැබීම් හඳුනා ගැනම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) ගම්පහ අධ්‍යයන මධ්‍යස්ථානයේ අනුමත තනතුරු සඳහා ප්‍රාදේශීය නිලධාරී විසින් දෛනික පදනම මත සේවයේ යොදවන ලද සේවකයින් 05 දෙනෙකු සඳහා රු.91,350 ක් වැටුප් ලෙස ගෙවා තිබූ නමුත් අදාල මුදල් ලබාගත් බවට සටහන් තබන ලද තාවකාලික ලේඛනය හැර සේවකයින් සේවයේ යෙදවූ බවට කිසිදු සාක්ෂියක් නොවීය.

දැනට මෙවැනි ගෙවීම් නවතා ඇති බව උපකුලපති විසින් දන්වා ඇත.

(ඇ) 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින මාධ්‍ය නිලධාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට විගණිත දින තෙක් කටයුතු කර නොතිබූ අතර මහජන සම්බන්ධතා නිලධාරී පත්කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණය පදනම් කරගෙන මාධ්‍ය නිලධාරී තනතුර සඳහා, අදාල සුදුසුකම් සම්පූර්ණ නොකළ හා එකී බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව නිලධාරිනියක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ඈ) පොළොන්නරුව හා කෑගල්ල අධ්‍යයන මධ්‍යස්ථාන වල සුළු මුදල් පාලනය, අයදුම්පත්‍ර අලෙවියෙන් ලැබෙන මුදල් හා විභාග අත්තිකාරම් මුදල් පාලනය සහ මධ්‍යස්ථානයේ පරිපාලනය භාරව කටයුතු කිරීම පිළිබඳ වගකීම, මාස 06 ක කාලයක් සඳහා තාවකාලිකව පත් කරන ලද අධ්‍යයන සහකාරවරුන්ට පවරා තිබුණි. මෙම මධ්‍යස්ථාන වලට අදාල මූල්‍ය ගනුදෙනු ඔවුන්ගේ පෞද්ගලික බැංකු ගිණුම් හරහා සිදුකර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.22,670,608 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු.130,145,436 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.152,816,644 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයෙන් ලද ප්‍රදාන රු.103,386,000 කින් වැඩි වීම මගින් සිදු වු බලපෑම හැර, දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ 2004 - 2009 කාලසීමාව තුල පරිත්‍යාග ලෙස ලද රු.2,255,300,751 ක් වු ස්ථාවර වත්කම් 2011 වර්ෂයේදී ගිණුම් තැබීමේදී වර්ෂයට අදාල රු.267,855,402 ක් වු ක්‍රමක්ෂය ආදායමක් ලෙස හඳුනාගැනීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් විය.

(අ) 256 ක් වු විශ්වවිද්‍යාලීය ආචාර්ය මණ්ඩලය විසන් 2011 වර්ෂයේ වාර්ෂික පරිසංවාදයට ඉදිරිපත් කර ඇති පර්යේෂණ වාර්තා සංඛ්‍යාව 95 ක් වැනි අඩු සංඛ්‍යාවක් වු අතර 2010 වර්ෂයේ මෙම ප්‍රමාණය 59 ක් විය.

(ආ) විශ්වවිද්‍යාලයේ සංයුක්ත සැලැස්මේ අරමුණු අනුව සිසුන් ලියාපදිංචි වන අවස්ථාවේම ඔවුන්ට අවශ්‍ය පාඨමාලා ද්‍රව්‍යද නිකුත් කල යුතු වේ. එසේ වුවද අධ්‍යයන වැඩසටහන් 03 කට අදාලව පාඨමාලා අත්පොත් 07 ක් ශිෂ්‍ය ලියාපදිංචි අවස්ථාවේ මධ්‍යම පාඨමාලා ද්‍රව්‍ය නිකුත් කිරීමේ මධ්‍යස්ථානය තුළ නොමැති වීමද අධ්‍යයන වැඩසටහන් 04 කට අදාල පාඨමාලා අත්පොත් 333 ක් ශිෂ්‍ය ලියාපදිංචි අවස්ථාවට පෙර ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන වෙත සපයා නොතිබීම හේතුවෙන් සිසුන්ට බෙදාහැරීමට නොහැකිව තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් විය.

(අ) අරමුදල් උපයෝජනය

(i) එකතුව රු.137,369,462 ක් ව විශේෂිත හා වෙනත් අරමුදල් 178 ක් පහිටුවා තිබු අතර ඉන් අරමුදල් 68 කට අදාලව වර්ෂය තුල කිසිදු ගනුදෙනුවක් සිදුවී නොතිබු බැවින් එම ගිණුම් වල වු රු.20,228,940 ක වර්ෂය තුල නිමකර ගැනීමට කටයුතු නොකර ගිණුම්වල පරිශේෂව පැවතුණි.

(ii) අරමුදල් 03 ක් සඳහා එකතුව රු.168,003 ක හර ශේෂයක් නිරීක්ෂණය විය.

(ආ) පාඨමාලා ද්‍රව්‍ය බෙදාහැරීමේ ඒකකය මගින් ඉවත් කරනු ලබන පාඨමාලා ද්‍රව්‍ය ජාතික කඩදාසි සමාගමට ණය පදනම මත අලෙවි කර තිබූ අතර මුදල් ලැබීම් පමණක් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව, 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම ගිණුම් ගත කර නොතිබූ අතර ලැබිය යුතු ආදායම හඳුනාගත හැකි ආකාරයට පොත් පත් වාර්තා පවත්වාගෙනද නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් 2004 වසරේ සිට අවස්ථා කිහිපයකදී ලැබී තිබූ රු.7,500,000 ක මුදලින් 2011 දෙසැම්බර් 31 දිනට රු.1,963,089 ක් එනම් 26.17 % ක් පමණක් වැයකර තිබුණි.

## 3.3 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් විය.

(අ) ගම්පහ, කෑගල්ල, කුරුණෑගල අධ්‍යයන මධ්‍යස්ථාන වල පස්තකාල පරීක්ෂා කිරීමේදී, එම පුස්තකාල පරිපාලනය සඳහා පුහුණු සේවකයින් යොදවා නොතිබීමත්, ප්‍රධාන පුස්තකාලය විසින් එම පුස්තකාල කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය නොකිරීමත්, පොත් බැහැර ගෙන යාමේ පහසුකම් සලසා නොතිබීමත්, ශ්‍රව්‍ය දෘශ්‍ය තැටි සපයා තිබූ නමුත් පරිගණක පහසුකම් නොමැති වීමත් හේතුවෙන් සිසුන්ගේ පුසතකාල පරිහරණය ඉතා පහල මට්ටමකට පත්ව තිබූ බවද කෑගල්ල අධ්‍යයන මධ්‍යස්ථාන පුස්තකාලය කිසිදු සිසුවෙකු පරිහරණය කර නොතිබූ බවද අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොග සත්‍යාපන වාර්තා අනුව 2007 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.158,820 ක් වූ භාණ්ඩ වර්ග 12 ක් හා 2010 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.1,920,000 ක් වූ $හොට් මෙල්ට් . වර්ගයේ මැලියම් කිලෝ ග්‍රෑම් 1,500 ක් සමාලෝචිත වර්ෂය තුළ චලනය වී නොතිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) 2011 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

අනුමත සත්‍ය පුරප්පාඩු

| | | | |
|---|---|---|---|
| අධ්‍යයන කාර්යමණ්ඩලය | 325 | 280 | 45 |
| අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය | 188 | 156 | 32 |
| පරිපාලන කාර්යමණ්ඩලය | 87 | 47 | 40 |
| අනධ්‍යයන කාර්යමණ්ඩලය | 653 | 529 | 124 |
| | 1253 | 1012 | 241 |

මේ අනුව විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 1253 ක් වූ අතර ඉන් 241 ක් එනම් 19 % ක් සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩුව පැවතුණි. මේ අතුරින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 19 % ක් ද අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ 13 % ක් ද පරිපාලන කාර්ය මණ්ඩලයේ 17 % ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 51% ද වශයෙන් ආංශිකව ඉහළ පුරප්පාඩු සංඛ්‍යාවක් විය.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ $ඉඩම් හා ගොඩනැගිලි උපදේශක. නමින් වූ තනතුරක් සඳහා තාවකාලික නිලධාරියෙකු වසර 3 කට අධික කාලයක් සඳහා (මාස 06 බැගින්) පත්කර තිබූ අතර ඉටුකළ කාර්යන් පිළිබඳ නිසි අධීක්ෂණයකින් තොරව 2011 වර්ෂය තුළ රු.310,270 ක් ගෙවීම් කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

2011 ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටුකළ යුතු බවට කාර්යන් 234 ක් නියම කර තිබුණද කාර්යන් 74 ක ප්‍රගතිය සම්බන්ධව තොරතුරු විගණනය වෙත වාර්තා නොකෙරුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තා අනුව කාර්යන් 46 ක කාර්ය සාධනය සම්බන්ධයෙන් තොරතුරු ප්‍රමාණවත්ව ඉදිරිපත් නොකෙරුණු අතර කාර්යයන් 11 ක් ඉටුකිරීම ප්‍රමාද කර තිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් විය.

(අ) 2011 අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව විවෘත විශ්වවිද්‍යාලයට අදාලව විෂය 09 ක් යටතේ ක්ෂේත්‍ර 21 ක් සඳහා සැලසුම් කළ කාර්යයන් ද ඉංග්‍රිසි පශ්චාත් උපාධි ආයතනය සඳහා සැලසම් කල සියළු කාර්යයන්ද විගණනය කර නොතිබුණි.

(ආ) ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තනතුරු සංඛ්‍යාවක් අනුමත කර ගැනීම හා බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.4 අයවැය පාලනය

අයවැය ලේඛනගත තොරතුරු හා සත්‍ය ආදායම වියදම අතර වූ පහත සඳහන් විචලනයන් සැලකිල්ලට ගැනීමේදී විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇතැයි සෑහීමකට පත්විය නොහැකි විය.

(i) 2011 වර්ෂයේ ආදායම් මුලාශ්‍ර 06 ක් සඳහා ඇස්තමේන්තු ගත ආදායම සහ සත්‍ය ආදායම අතර 35% සිට 368% දක්වා විචලනයන් නිරීක්ෂණය වූ අතර 2011 වර්ෂයේ උපයා තිබූ අභ්‍යන්තර ආදායම ඇස්තමේන්තු ගත ආදායම් ප්‍රමාණය 75% කින් ඉක්මවා තිබුණි. 2010 වසරේ එය 51% කින් හා 2009 වසරේ 27% කින් ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවා තිබූ අතර අභ්‍යන්තර ආදායම අඩුවෙන් ඇස්තමේන්තු කිරීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වේ.

(ii) 2011 වර්ෂයේ වැය ශීර්ෂ 39 ක් සඳහා ඇස්තමේන්තු ගත වියදම සහ සත්‍ය වියදම අතර විචලනය 31% සිට 983% ක් දක්වා විය.

## 5. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අභ්‍යන්තර පාලනය.

(ආ) සංචාරක බංගලා පරිපාලනය.

(ඇ) ගබඩා පාලනය.

(ඈ) පැමිණීමේ හා නිවාඩු ලේඛණ පවත්වාගෙන යාම.

(ඉ) මුදල් හා බැංකු